චක්‍රලේඛ අංක 1995/19

මගේ අංකය :- 4/අධ්‍ය. සේ. /ආ /1/125
අධ්‍යාපන සේවා අයාතන ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය'
බත්තරමුල්ල.

1995.07.24 වන දින.

සියලුම අතිරේක ලේකම්වරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
ප්‍රධාන කොමසාරිස් (ගු. අ. ප. හා අ. වි. පී)
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
පළාත් අධ්‍යාපන ලේකම්වරු
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කළාප භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම.

රාජ්‍ය නිලධාරීන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 5 :2 :1 හා 5: 2: 2 වැනි ඡේදවල විධිවිධාන (1985 සංශෝධනය - ඉංග්‍රීසි) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

02 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම පිණිස මෙම අමාත්‍යාංශය වෙත නිර්දේශ කිරීමේදී මින් ඉදිරියට පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කරන මෙන් මෙයින් දන්වමි.

(අ) සේවා කාලය දීර්ඝ කරවා ගැනීමට බලාපොරොත්තු වන සියළුම නිලධාරීන් විශ්‍රාම ගැනීමේ වෛකල්පිත වයසට එළඹීමට මාස 06 කට කලින් ද දනට දීර්ඝ කරනු ලැබූ සේවා කාලය ඉකුත් වීමට යටත් පිරිසෙයින් මාස 03 කට කලින් ද, ඔබ වෙත ලිඛිත ඉල්ලීමක් කළයුතු බව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් වෙත දනුම් දෙන්න.

(ආ) පසු පිට ඇති සංශෝධිත ආකෘතියට අනුව සකස් කල වාර්තාව ඔබගේ නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශයේ අධ්‍යාපන සේවා ආයතන ශාඛාවට ලැබෙන සේ ඉදිරිපත් කල යුතුය. වාර්තාව සමඟ නිලධාරියාගේ ඉල්ලීමද කරුණාකර ඉදිරිපත් කරන්න.

(ඇ) හැකිතාක් දුරට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ සේවා දීර්ඝ කිරීමේ නිර්දේශ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන ලේකම් විසින්ම අත්සන් කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

(ඈ) කොට්ඨාශ/ කළාප කාර්යාල විසින් පළාත් කාර්යාලය වෙත ද පළාත් කාර්යාල හා දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් විසින්, එම අමාත්‍යාංශයට ද සේවය දීර්ඝ කිරීමේ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද කාලානුක්‍රමික සීමා නියම කල යුතු වේ.

(ඉ) නියමිත දින ඉකුත් වීමෙන් පසුව සේවා දීර්ඝ කිරීමක් නොලබා සේවයේ රැඳී සිටින නිලධාරීන්ගේ වැටුප් ගෙවීම පිළිබඳ වගකීම් අමාත්‍යාංශය නොදරයි. සේවය දීර්ඝ කිරීම

අනුමත නොකරනු ලැබුව හොත් නියමිත දින ඉක්මවා නිලධාරියා සේවයේ යොදවා තිබීම පිළිබඳ වගකීම අදාල ආසන්නතම ප්‍රධානියා හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා වෙත පැවරේ.

(ඊ) සිරිතක් වශයෙන් සෑම නිලධාරියෙකුගේම සේවය දීර්ඝ කිරීම නිර්දේශ කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කල යුතු නැත. නිලධාරියෙකු වයස අවුරුදු 55 න් ඔබ්බට විශේෂයෙන් ම වයස අවුරුදු 58 න් ඔබ්බ ට සේවයේ රඳවා ගත යුත්තේ සේවයේ අවශ්‍යතාවයන්, සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩු, නිලධාරියාගේ විශේෂ හැකියාවන්/, කුශලතාවයන් හෝ දැනුම, ඔහුගේ හැසිරීම, සේවය කෙරෙහි දක්වන උනන්දුව, මහජනයා සහ මහජන නියෝජිතයින් සමග ද ආයතනයේ අනෙකුත් කාර්ය මණ්ඩලය සමඟද කටයුතු කිරීමේදී නිලධාරියාගේ සාර්ථක අසාර්ථක භාවය වැනි කරුණු ඉතා මැනවින් හා සුපරීක්ෂාකාරීව සලකා බැලීමෙන් පසු සේවය දීර්ඝ කිරීම නිර්දේශ කිරීම හැම අතකින්ම යෝග්‍ය වන්නේ නම් පමණි.

සේනානායක උපසේන
අතිරේක ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
මාතෘාංශයේ ලේකම් වෙනුවට

මගේ අංකය
අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කොට්ඨාශ
අධ්‍යාපන කාර්යාලය
199................. වෙනි දින.

අධ්‍යා./ලේ. (අධ්‍යාපන සේවා ආයතන ශාඛාව)

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම

01 නිලධාරියාගේ නම 1 මුලකුරු සමග :-
2 සම්පූර්ණ නම:-

02 ශ්‍රී. ලං. අ. ප. සේ./ශ්‍රී. ලං. වි. සේ.
ට අයත් පංතිය/ශ්‍රේණිය:-

03 දනට දරණ තනතුර හා නිලධාරියාට පැවරී ඇති කාර්‍ය භාරයන් පිළිබඳ විස්තර :-

04 සේවා ස්ථානය :-

05 (අ) උපන් දිනය :-
(ආ) මීලඟ උපන් දිනයට වයස :-

06 වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනය :-

07 වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා කාලය දීර්ඝ කර තිබේ නම් අමාත්‍යාංශයේ ලිපි ගොනුවේ යොමුව දක්වන්න :-

08 සේවා කාලය දීර්ඝ කරන ලෙස නිලධාරියා ඉල්ලා ඇති කාල සීමාව (නිලධාරියාගේ ඉල්ලීමද මේ සමඟ එවම්) :-

09 නිලධාරියාට විරුද්ධව දනට විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් කිසිවක් තිබේ නම් ඒවායේ විස්තර හා වර්තමාන තත්වය :-

10 පසුගිය තුන් (3) වසර තුල නිලධාරියා වැටුප් රහිත නිවාඩු ලබා තිබේද? ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර :-

11 නිලධාරියාට විරුද්ධව මහජන පැමිණිලි හා පෙත්සම් ආදිය කිසිවක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර

12 නිලධාරියාගේ රාජකාරී කටයුතු පැමිණීම හා හැසිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ :-

13 සේවා කාලය දීර්ඝ කිරීම පිළිබඳ නිර්දේශය :-
කාලසීමාවද නිශ්චිතව සඳහන් කරන්න. වයස අවුරුදු 58 ඉක්මවා ඇත්නම් නිලධාරියා තවදුරටත් සේවයේ යොදවා ගැනීම බෙහෙවින් අවශ්‍ය වීමට හේතු තිබේද යන්න විශේෂයෙන් සඳහන් කරන්න. විශේෂයෙන්ම ප්‍රදේශයේ මහජනතාව හා මහජන නියෝජිතයන් සමග කටයුතු කිරීමේදී නිලධාරියා දක්වා ඇති විචක්ෂණ භාවය කවරේද යන්න පැහැදිලි කරන්න.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
දිනය :- නම සහ නිල නාමය